1. **සමාජිකත්වය ලබාදීමේ ක්‍රියා පිළිවෙත**.

මෙම පිහිණුම් තටාක සංකිර්ණයේ ඇති පහසුකම් පරිහරණය කිරිම සඳහා රණවිරු ඇපරල් සාමාජිකයින්, ත්‍රිවිධ හමුදාවේ සහ සිවිල් අයවළුන් සාමාජිකත්වය ලබාගත යුතුවේ. සිවිල් අයවළුන් සඳහා සමාජිකත්වය ලබාදිමේදි යහපත් සමාජ විනයකින් හෙබි වැදගත් පවුල් සමාජ පසුබිමක් ඇති පුද්ගලයන් සඳහා පමණක් ලබාදිය යුතු අතර, ඒ සඳහා නිසි අධීක්ෂණයකින් පසුව අනුමැතිය ලබාදිම පිහිණුම් තටාක පරිපාලන කමිටුව විසින් සිදු කළ යුතුයි. එසේම ව්‍යාපෘතියේ සියළුම කටයුතු යුද්ධ හමුදාවේ හා රණවිරු ඇපරල්හි කිර්තිනාමයට හානියක් නොවන අයුරින් සිදු කිරිමටත් සමාජිකත්වය ලබාදිමේදි පහත සදහන් කරුණු පිළිබඳව සළකා බැලිය යුතු බව මණ්ඩලය නිර්දේශ කරයි.

අ. **සාමාජිකත්වය ලබාදීමේ පිළිවෙත.**

(1) මේ සදහා වන අයදුම්පත් පිහිණුම් තටාක සංකිර්ණයේ ඇති කාර්යාලයෙන් හෝ වෙබ් අඩවිය මගින් ලබාගත් අයදුම්පතක් මගින් ඉල්ලුම් කල හැකි අතර එහි සිංහල අයදුම්පත ඇමුණුම ‘අ’ වශයෙන් දක්වා ඇති අතර සාමාජිකත්ව අයදුම්පත ඉදිරිපත් කිරිමේදි රු.50/= ක මුදලක් සමග ඉදිරිපත් කළ යුතුය.

(2) පිහිණුම් තටාකයේ සේවය ලබාගැනීම වෙනුවෙන් වර්ගකිරිම.
(Swimming Pool Category of Service)

| **Types of Personnel** | **Category** |
|---|---|
| Ranaviru Apparel Disable ORs | - A |
| Ranaviru Apparel Disable Officers | - B |
| Ranaviru Apparel Serving ORs | - C |
| Ranaviru Apparel Serving Officers | - D |
| RVAPL Disable ORs family members | - E |
| RVAPL Disable Officers family members | - F |
| Army All Disable ORs | - G |
| Army All Disable Officers | - H |
| Army Serving ORs | - J |
| Army Serving Officers | - K |
| Retd Army Disable ORs | - L |
| Retd Army Disable Officers | - M |
| Retd Army ORs | - N |
| Retd Army Officers | - O |
| Any Other Services | - P |
| **Civilians** | |
| Civil Indivuduals | - Q |
| Civil Families | - R |
| Civil – Sports Clubs / Entity/ Establishments | - S |
| Students | - T |
| Schools/ School Clubs | - U |

(3) සාමාජිකයින් සඳහා අයකරනු ලබන ගාස්තු පහත සඳහන් පරිදි නිර්දේශ කෙරේ.

| Category | Membership Charges (Rs.) | Annual Subscription (Rs.) | Maximum Family Members | Charges for exceeding family members (Rs) per head | Remarks ** |
|---|---|---|---|---|---|
| A | Free | 250.00 | - | - | Max 2hrs per day |
| B | Free | 250.00 | - | - | Max 2hrs per day |
| C | 500.00 | 1000.00 | 4 | 100.00 | Max 2hrs per day |
| D | 1000.00 | 2000.00 | 4 | 100.00 | Max 2hrs per day |
| E | 500.00 | 1000.00 | 4 | 50.00 | Max 2hrs per day |
| F | 1000.00 | 2000.00 | 4 | 100.00 | Max 2hrs per day |
| G | 500.00 | 1000.00 | 4 | 100.00 | Max 2hrs per day |
| H | 750.00 | 2500.00 | 4 | 100.00 | Max 2hrs per day |
| J | 500.00 | 2500.00 | 4 | 100.00 | Max 2hrs per day |
| K | 1000.00 | 5000.00 | 4 | 100.00 | Max 2hrs per day |
| L | 500.00 | 1000.00 | 4 | 100.00 | Max 2hrs per day |
| M | 1000.00 | 2,500.00 | 4 | 100.00 | Max 2hrs per day |
| N | 1000.00 | 2500.00 | 4 | 100.00 | Max 2hrs per day |
| O | 1,000.00 | 5000.00 | 4 | 100.00 | Max 2hrs per day |
| P | 2000.00 | 7500.00 | 4 | 100.00 | Max 2hrs per day |
| Q | 3000.00 | 5000.00 | 4 | 250.00 | Max 2hrs per day |
| R | 3000.00 | 6000.00 | 4 | 250.00 | Max 2hrs per day |
| S | 10000.00 | 50000.00 | 20 | 250.00 | Maximum 2 hrs 3 days per week |
| T | 2000.00 | 7500.00 | - | 50.00 | Maximum 2 hrs 3 days per week |
| U | 8000.00 | 30000.00 | 20 | 50.00 | Maximum 2 hrs 3 days per week |

**** භාවිතා කල හැකි උපරිම පැය ගණනින් පසු සෑම අතිරේක පැයක් සඳහාම එක් අයෙකුගෙන් රු.150.00 ක් අය කෙරේ.**

(අ) පිහිණුම් තටාකයේ සාමාජිකත්වය ලබා ගන්නා මුල්ම දිනයේදීම සාමාජික ගාස්තු සහ වාර්ෂික දායකත්වය එකවර ගෙවිය යුතු වේ.

(ආ) සාමාජික ගාස්තු/වාර්ෂික දායකත්ව ගාස්තු අදාල නොවන අයවළුන් සඳහා. (Non Membership Chargers) - Rs.250.00 per hour

(ඇ) **<u>විශේෂ සාමාජිකත්වය ලබාගැනීම (Special Membership)</u>**

(i) **ප්ලැටිනම් ප්ලස් (Platinum plus)**

- මුහුණත වටිනාකම 125,000.00
- වසර 5ක් යනතෙක් වාර්ෂික සාමාජික ගාස්තු අය නොකෙරෙන අතර සේවාව ලබා දෙන වර්ගකිරීම අනුව ඉන්පසු අයකෙරේ.
- සතියක් ඇතුලත දින 3ක් සඳහා පැය 2 බැගින් තටාකය භාවිතා කිරීමට අවස්ථාව ලැබෙන අතර සෑම අතිරේක පැයක් සඳහාම සාමාජික ගාස්තු/ වාර්ෂික දායක ගාස්තු අදාල නොවන අයවළුන් වෙනුවෙන් අයකෙරෙන ගාස්තුව ගෙවිය යුතුවේ.
- අතිරේක සාමාජිකයන් 5ක් සඳහා සතියකට ගෙවීමකින් තොරව අවස්ථාව ලැබේ.

- වසරකට අවස්ථාවන් 2කදී උත්සවයක් හෝ රැස්වීමක් සඳහා ගෙවීමකින් තොරව ලබා ගත හැකි අතර උපරිම සංඛ්‍යාව **30** කට සීමාවේ.

(ii) **ප්ලැටිනම් (Platinum)**

- මුහුණත වටිනාකම 100,000.00
- වසර 4ක් යනතෙක් වාර්ෂික සාමාජික ගාස්තු අය නොකෙරෙන අතර සේවාව ලබා දෙන වර්ගකිරීම අනුව ඉන්පසු අයකෙරේ.
- සතියක් ඇතුලත දින **3**ක් සඳහා පැය **2** බැගින් තටාකය භාවිතා කිරීමට අවස්ථාව ලැබෙන අතර සෑම අතිරේක පැයක් සඳහාම සාමාජික ගාස්තු/ වාර්ෂික දායක ගාස්තු අදාල නොවන අයවළුන් වෙනුවෙන් අයකෙරෙන ගාස්තුව ගෙවිය යුතුවේ.
- අතිරේක සාමාජිකයන් 4ක් සඳහා සතියකට ගෙවීමකින් තොරව අවස්ථාව ලැබේ.
- වසරකට අවස්ථාවන් 2කදී උත්සවයක් හෝ රැස්වීමක් සඳහා ගෙවීමකින් තොරව ලබා ගත හැකි අතර උපරිම සංඛ්‍යාව **25** කට සීමාවේ.

(iii) **ගෝල්ඩ් (Gold)**

- මුහුණත වටිනාකම 75,000.00
- වසර 3ක් යනතෙක් වාර්ෂික සාමාජික ගාස්තු අය නොකෙරෙන අතර සේවාව ලබා දෙන වර්ගකිරීම අනුව ඉන්පසු අයකෙරේ.
- සතියක් ඇතුලත දින **3**ක් සඳහා පැය **2** බැගින් තටාකය භාවිතා කිරීමට අවස්ථාව ලැබෙන අතර සෑම අතිරේක පැයක් සඳහාම සාමාජික ගාස්තු/ වාර්ෂික දායක ගාස්තු අදාල නොවන අයවළුන් වෙනුවෙන් අයකෙරෙන ගාස්තුව ගෙවිය යුතුවේ.
- අතිරේක සාමාජිකයන් **3**ක් සඳහා සතියකට ගෙවීමකින් තොරව අවස්ථාව ලැබේ.

(iv) **සිල්වර් (Silver)**

- මුහුණත වටිනාකම 50,000.00
- වසර 2ක් යනතෙක් වාර්ෂික සාමාජික ගාස්තු අය නොකෙරෙන අතර සේවාව ලබා දෙන වර්ගකිරීම අනුව ඉන්පසු අයකෙරේ.
- සතියක් ඇතුලත දින 2ක් සඳහා පැය 2 බැගින් තටාකය භාවිතා කිරීමට අවස්ථාව ලැබෙන අතර සෑම අතිරේක පැයක් සඳහාම සාමාජික ගාස්තු/ වාර්ෂික දායක ගාස්තු අදාල නොවන අයවළුන් වෙනුවෙන් අයකෙරෙන ගාස්තුව ගෙවිය යුතුවේ.
- අතිරේක සාමාජිකයන් 2ක් සඳහා සතියකට ගෙවීමකින් තොරව අවස්ථාව ලැබේ.

(ඇ) ඉහතින් දක්වන ලද විශේෂ සාමාජිකත්වයක් ලබාගැනීම සඳහා වන පොදු කොන්දේසි (Conditions)

- අවුරුදු 12 ට අඩු දරුවන් සඳහා අයකෙරෙන ගාස්තුවෙන් හරි අඩක් සෑම අතිරේක පැයක් සඳහා ගෙවිය යුතුය.
- පිහිනුම් තටාක වේලාවන් තුලදී පමණක් වලංගු වේ.

(ඉ) (i) __ක්‍රීඩා සහ උත්සව කටයුතු සඳහා ලබාදීම__. මුදල් අය කිරීමේ පදනම මත මෙම පිහිණුම් තටාක සංකීර්ණය උත්සව සහ ක්‍රීඩා තරග පැවැත්වීමට ලබාගත හැකි අතර, එය පිහිණුම් තටාක පරිපාලන කමිටුව වෙත ලිඛිතව දැනුම් දීමෙන් පසු එහි නිර්දේශය සමග සේනාවිධායකගේ අනුමැතිය මත වෙන් කරවා ගත හැක. එසේම තටාකාංගනයේ කටයුතු

ගැටළුවකින් තොරව ක්‍රියාත්මක කිරීමට ඒ ඒ අයවලුන්ගෙන් අය කිරීමට නියමිත ගාස්තු පහත පරිදි වියයුතු බැව් නිර්දේශ කරයි.

| විස්තරය | සේවය ලබා ගන්නා ආයතනය සහ පුද්ගලයින් උපරිම සංඛ්‍යාව | පැය 5 ක් සඳහා ගාස්තුව | නැවත ගෙවනු ලබන ඇප මුදල | වැඩිවන සෑම පැයක් සඳහා අයකිරීම |
|---|---|---|---|---|
| රණවිරු ඇපරල් සාමාජිකයන් (දැනට සේවයේ යෙදී සිටින අයවළුන් පමණයි | **50** | 20,000.00 | 10,000.00 | 5000.00 |
| සියළු යුධ හමුදා සාමාජිකයින් | **50** | 25,000.00 | 10,000.00 | 7,000.00 |
| සිවිල් කණ්ඩායම් සඳහා | **50** | 40,000.00 | 15,000.00 | 10,000.00 |
| දිනකට සම්පූර්ණ ක්‍රීඩා සංකීර්ණය වෙන්කිරීම | උත්සවයේ ස්වභාවය සහ සහභාගි වන අයවළුන් අනුව තීරණය වේ | 100,000.00 | 30,000.00 | 25,000.00 |

(ii) **උත්සව හා ක්‍රීඩා සඳහා වෙන් කිරීමේදී පහත කොන්දේසි අදාල වේ.**

(1) පිහිණුම් තටාකය වෙන් කරවා ගැනීම දින 07කට පෙර සිදුකළ යුතුය.

(2) වෙන් කරන ලද නියමිත දිනට පෙර අදාළ ගාස්තුවෙන් 50% ක අත්තිකාරම් මුදලක් වෙන්කරවා ගන්නා අවස්ථාවේදී ගෙවිය යුතුය.

(3) සහභාගිවන්නන් සඳහා ආහාර පාන ලබා ගැනීම / ලබා දීමට අදාලව පරිපාලන කමිටුවෙහි උපදෙස් මත පමණක් සිදු කළ යුතුය.

**<u>සාමාජිකත්වය ලබාදීමේදී සැලකිය යුතු කොන්දේසි</u>**

(ඊ) සමාජිකත්වය ලබාදීම සඳහා ඉල්ලුම් කරනු ලබන අයදුම්පත් පිහිණුම් තටාක සංකීර්ණ කාර්යාලය වෙතින් අයදුම්කරුවන්ගේ තොරතුරුවල නිවැරදිතාවය තහවුරු කර ගැනීමෙන් අනතුරුව පිහිණුම් තටාකය භාර නිලධාරි වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වේ.

(උ) පිහිණුම් තටාකය භාර නිලධාරි/කාර්යාලය වෙතින් සුදුසුකම් ලාභීන්ගෙන් දින 02 ක් ඇතුලතදී මුදල් ලබාගෙන සමාජිකත්ව කාඩ්පත නිකුත් කළ යුතු වේ. එහි සාමාජිකයාගේ නම, සාමාජික අංකය, සාමාජිකත්ව වර්ගය හා ඡායාරූපය අඩංගු වියයුතු අතර, එය පිහිණුම් තටාක සංකීර්ණය භාර නිලධාරිගේ අත්සනින් නිකුත් කරනු ලැබේ. සාමාජිකත්වය ලබා ගැනීමට ප්‍රථම පිහිණුම් තටාකය පරිහරණයේදී පිළිපැදිය යුතු කරුණු පිළිබඳව සියළුම අයදුම්කරුවන්ට අවබෝධයක් ලබාදීම කාර්‍ය්‍ය මණ්ඩලයේ වගකීම වේ.

(ඌ) සාමාජිකත්වය ලබා ගැනීමෙන් අනතුරුව පිහිණුම් තටාකය පරිහරණය කිරීමේදී පිළිපැදිය යුතු නීතිරීති කඩ කරන අයවළුන්ගේ සාමාජිකත්වය තහනම් කළ හැකි බැව් ඔවුන් හට අවබෝධ කරදිය යුතුය.

(එ) සාමාජික කාඩ්පත් අන් අයකුට පැවරිය නොහැකි අතර, සාමාජික කාඩ්පත් අස්ථානගත වූ අවස්ථාවකදී සාමාජිකයා විසින් ඒ පිළිබඳව පිහිණුම් තටාක සංකීර්ණය භාර නිලධාරි වෙත ලිඛිතව දැනුම් දිය යුතුය. නැවත නව සාමාජික කාඩ්පතක් ලබා ගැනම සඳහා සාමාජිකයා විසින් රු 500.00 ක මුදලක් ගෙවිය යුතුය.

(ඒ) සාමාජිකත්වය වාර්ෂිකව අලුත් කිරීම සඳහා සියළු සාමාජිකයන් හට තම සාමාජික හැඳුනුම්පත ඉදිරිපත් කර වාර්ෂික ගාස්තු ගෙවා සාමාජිකත්වය වාර්ෂිකව අලුත්කර ගත යුතුය. සෑම සාමාජිකයෙකුටම වාර්ෂික සාමාජිකත්වය අලුත් කිරීම පිළිබඳව කල්වේලා ඇතිව ලිඛිතව/විද්‍යුත් තැපැල මගින් දැනුවත් කළ යුතු වේ. වාර්ෂික සාමාජිකත්ව ගාස්තු ගෙවීම වසර 02 ක් පැහැර හැරීම සාමාජිකත්ව අහිමි වීමට හේතු වේ.

(ඔ) සාමාජිකයා වසර 02 කට වැඩි කාලයක් සඳහා දිවයිනෙන් පිටව යාමට අපේක්ෂා කරන්නේ නම් ඒ පිළිබඳව ලිඛිතව දැනුම් දීමක් කළ යුතු අතර, ඒ වෙනුවෙන් වාර්ෂික සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු නිදහස් කිරීම පිහිණුම් තටාක සංකීර්ණය භාර නිලධාරි සතුවේ.

(ඕ) සාමාජිකත්වය ලබාගෙන ඇති කිසියම් සේවා/සිවිල් සාමාජිකයෙකු අවිනීත හැසිරීමක් මගින් අපකීර්තියක් සිදුකරයි නම් සාමාජිකත්ව අවලංගු කිරීමේ බලය පිහිණුම් තටාක පරිපාලන කමිටුවෙහි නිර්දේශ මත සේනාවිධායකගේ අනු දැනුම මත සිදු කළ යුතු වේ.

(ක) සාමාජිකත්වය අවලංගු කිරීමට හේතු වූ කාරණා පිහිණුම් තටාක සංකීර්ණය භාර නිලධාරි විසින් ලිඛිතව සේනාවිධායක වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ සබැඳිව අදාල සාමාජිකයා හට ලිඛිතව දැනුම්දිය යුතු වේ.

(ග) සාමාජිකයකුගේ (පුද්ගල/ආයතනයක) අවිනීත හැසිරීම හෝ විනය විරෝධි ක්‍රියාවක් පිහිණුම් තටාක සංකීර්ණය පවත්වාගෙන යාම සඳහා පනවා ඇති නීතිරීති උල්ලංඝනය කරන අවස්ථාවකදී ඒ සබැඳිව පිහිණුම් තටාක භාර නිලධාරි විසින් සේනාවිධායක දැනුවත් කිරීම සිදු කළ යුතුයි.

(ඩ) කිසියම් සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අහිමි කරන අවස්ථාවන් වලදී නැවත මුදල් ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

(ච) සාමාජිකයෙකු මියයාමේදී එම පවුලේ සාමාජිකත්වය වෙනත් අයෙකුට පැවරීමට සුදුසුද යන්න තීරණය කිරීම එයට අදාල කරුණු හැදෑරීමෙන් පසුව පිහිණුම් තටාක පරිපාලන කමිටුවේ නිර්දේශය මත සේනාවිධායකගේ අනුමැතිය ලබාගත යුතු අතර ඒ සබැඳිව අදාල පාර්ශවය වෙතින් ලිඛිත ඉල්ලීමක් ලබා ගැනීම පිහිණුම් තටාක භාර නිලධාරි/ කාර්ය මණ්ඩලය විසින් සිදු කළ යුතුවේ.

2. **<u>පිහිණුම් තටාක පරිශ්‍රය විවෘතව තබන වේලාවන් හා පොදු උපදෙස්</u>**

අ. උදැසන 0600 පැයේ සිට රාත්‍රි 2200 පැය දක්වා (පෝය දින හැර) වෙන්කර ගත හැකි වන අතර, රාත්‍රි කාලයේ පවත්වනු ප්‍රිය සම්භාෂණ/උත්සව 2200 පැයට ප්‍රථම නිමා කළ යුතුය.

ආ. රණවිරු ඇපරල් යක්කල සහ අලව්ව කර්මාන්තශාලාවන්හි සේවයේ නියුතු ආබාධිත නිලධාරි/සෙනින් ඇතුලු භාවිතා කිරීමට කැමති අයවළුන් සඳහා 1630 පැයේ සිට 1830 පැය දක්වා (විශේෂ උත්සව අවස්ථාවන් හැර) කාලය තුල ප්‍රයෝජනය සඳහා ලබාදිය හැක.

ඇ. පිහිණුම් තටාක පරිශ්‍රයේ/ආරක්ෂාව නිසි අනුමැතියකින් තොරව ප්‍රිය සම්භාෂණ/උත්සව පැවැත්වීම මත්පැන් පානය කිරීම හා ආහාර අනුභව කිරීම සපුරා තහනම් වන අතර, පිහිණුම් තටාකය සාමාජිකයන්ගේ පරිහරණය සඳහා සූදානම් කර තැබිය යුතුය. පිහිණුම් තටාකය

ආශ්‍රිතව සාද පැවැත්වීම සඳහා අවැසි අවස්ථා වලදී එම වේලාවන් කල්වේලා ඇතිව වෙන්කරවා ගත යුතුය.

ඇ. ප්‍රිය සම්භාෂණ/උත්සව සඳහා අධි රිද්ම හෝ වෙනත් සංගීත කණ්ඩායම් යොදා ගන්නේනම් ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයන්හි පමණක් ස්ථානගත කල යුතු අතර, ඊට අවශ්‍ය විදුලි සැපයුම් සහ අනෙකුත් අවශ්‍යතාවයන් පිහිණුම් තටාකය භාර නිලධාරීගේ සම්බන්ධීකරණයෙන් ලබාගත යුතුය.

ඉ. පෝය දිනයන් හි පිහිණුම් තටාක පරිශ්‍රය වසා තබනු අතර, පිරිසිදු කිරීම් කටයුතු දෛනිකව සිදුකල යුතුය. කිසියම් හේතුවකින් හෝ යුධ හමුදා/රෙජිමේන්තු විශේෂ උත්සව අවස්ථාවන්හිදී සාමාජිකයන් සඳහා ඇතුල්වීමට අවසර දෙනු නොලැබේ. පුද්ගලිකව මේ සඳහා කෙටි පණිවිඩ (SMS) මගින් දැනුම්දීම සිදු කරනු ලබන අතර, ඒ සැබැදිව පෙර දැනුම්දීමක් සතියකට පෙර දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශණය කල යුතුය.

ඊ. බෝවන රෝග චර්ම රෝග, සෙම්ප්‍රතිශ්‍යාවන්, තුවාල, ඇදුම රෝගය හෝ පිහිණුම් තටාක භාවිතා නොකිරීමට නිර්දේශිත රෝග ඇති අයවළුන් සඳහා තටාකය භාවිතා කිරීමට අවසර නොමැත.

උ. පිහිණුම් තටාකය භාවිතයට පෙර සබන් යොදා ස්නානය කර පිරිසිදු වීමෙන් පසු ක්‍රමාණුකූලව පිහිණුම් ඇඳුම් භාවිතා කිරීම අනිවාර්‍ය්‍ය වේ. පිහිණුම් ඇඳුමින් සමාජශාලාව හෝ කාර්යාලය වෙත ඇතුල්වීම සපුරා තහනම් වන අතර, සමාජශාලාවට ඇතුල්වීමට සුදුසු ඇඳුමක් භාවිතා කල යුතුයි.

ඌ. දිගු හිසකෙස් ඇති අය තටාකය භාවිතා කිරීමේදී හිස් වැස්මකින් හිස ආවරණය කල යුතුවේ.

එ. ඇඳුම් මාරුකිරීම සඳහා වෙන් කර ඇති ස්ථාන තුළදී පමණක් ඇඳුම් මාරුකිරීම සිදුකල යුතුය.

ඒ. ආහාරපාන පිටතින් රැගෙන ඒම සපුරා තහනම් අතර, ඒ සඳහා පහසුකම් සපයා ඇති ස්ථාන වෙතින් පමණක් ලබාගත යුතුයි.

ඔ. තටාකය තුළ මත්පැන් පානය හා තටාකය තුළට හා ඒ අවට භූමියට සුරතල් සතුන් රැගෙන ඒම සපුරා තහනම් වේ.

ඕ. අවිනීත ලෙස හැසිරෙන අයවළුන් පිහිණුම් තටාකයෙන් ඉවත්කරලීමට අදාල බලය පිහිණුම් තටාකයභාර නිලධාරී/කාර්ය මණ්ඩලයේ වගකීම වේ.